## ඡන්දයක් දෙන්න වටිනම කෙනෙක් -
## කොටිබල නැසූ සටනේ
# සැබෑ විරුවෙක්



- ත්‍රස්තවාදය පරාජය කළ යුතුය, එය කළ හැකිය කියා සිතූ, පැවසූ ඒ අනුව ක්‍රියා කළ රණ විරුවෙක්.
- රටට සැබැවින්ම ආදරය කරන අවංක දේශප්‍රේමියෙක්.
- දෙස් විදෙස් බුහුමන් ලැබූ, උගත්, බුද්ධිමත්, වැදගතෙක්.
- සතයක් හෝ වංචා නොකළ, පිරිසිදු අංවක රාජ්‍ය සේවකයෙක්.
- ගුණගරුක, ධර්මිශ්ඨ අඳීන මිනිසෙක්.
- සතා සීපාවට පවා ආදරය කරන පරිසර හිතකාමියෙක්.
- අයුක්තියට රැහැනිව නැගීසිටි අපේ කාලයේ වීරයෙක්.

## ඔහුට වඩා සුදුස්සෙක් තවත් සිටී ද ?

**24**


ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කටයුතු
160, යක්කල පාර, ගම්පහ.
දුර: 0777-275566 ( කොටකදෙනිය මහතා ),
060-2720990
ඊ-මේල්: kotake@sltnet.lk


## පිබිදෙන මව්බිමට
## වීරෝදාර
## නායකයෙක්

# 24



එක්සත් ජනතා නිදහස් සංධානය
**ගම්පහ දිස්ත්‍රික්කය**

හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති

# එච්. එම්. ජී. බී. කොටකදෙනිය



# පිබිදෙන මව්බිමට - වීරෝදාර නායකයෙක්

## එච්. එම්. ජී. බී. කොටකදෙනිය

කොටකදෙනිය නාමය ඇසුණු සැනින් සිහියට එන්නේ සිය සමස්ථ රාජකාරි ජීවිතයම පාහේ කොටි ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ සද් කාර්යය වෙනුවෙන් කැප කළ අධිෂ්ඨානශීලී, කාර්යක්ෂම එමෙන්ම අවංක පොලිස් නිලධාරියෙකුගේ අසමසම යැයි කිව හැකි ජීවන චරිතයයි.

උගතුන්ගෙන්, බුද්ධිමතුන්ගෙන් පමණක් නොව රටට ආදරය කරන මිනිසුන්ගෙන්ද පිරුණු ගම්පහ දිස්ත්‍රික්කයට නායකත්වයක් දීම සඳහා අවශ්‍ය පරිණතභාවයද, උගත්කමද, අවංකම හා නිර්ව්‍යාජත්වයද, කාර්යක්ෂමතාවද, දේශප්‍රේමීත්වය හා මනුෂ්‍යත්වයද යන මේ සියලු ගුණාංග ඔහුගේ චරිතය තුළ නොඅඩුව පවතී.

මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ එච්. මි. පී. බී. කොටකදෙනිය මහතා 1960 දී පේරාදෙනිය විශ්ව විද්‍යාලයට ඇතුලත්ව 1964 දී ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය ලබා ගත්තේය. අනතුරුව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීති උපාධිය (LLB) ලබා ගත් ඒ මහතා 1966 වර්ෂයේදී සහකාර නියෝජ්‍ය පොලිස් අධිකාරිවරයෙකු වශයෙන් පොලිස් සේවයට බැඳුණේ එවන් ඉහළ අධ්‍යාපනික පසුබිමක් සහිත අයෙකු වශයෙනි. එසේම කොටකදෙනිය මහතා ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ ලැබූ පුහුණුවට අමතරව පොලිස් සේවා පිළිබඳ එංගලන්තයේ බ්‍රැම්ස්හිල් පොලිස් විද්‍යාලයේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පිහිටි ඕස්ට්‍රේලියානු පොදු රාජ්‍ය මණ්ඩලීය පොලිස් විද්‍යාලයේත් පුහුණුව ලබමින් සිය දැනුම හා පුහුණුව මුවහත් කර ගත්තේය. පසුකාලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන්ද එසේම ඉන්පසුව ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශකවරයෙකු වශයෙන්ද රාජකාරි කිරීමට ඒ මහතාට උපකාරී වූයේ එම පසුබිමයි.

ඔහුගේ සේවා කාලය තිස්හය වසරකි. ඒ සමස්ථ සේවා කාලය පුරා දිවෙන රන්දමක් වන්නේ නීතිගරුක, අවංක සිය ජාතිය ආගම වෙනුවෙන් ආදරයක් දැක්වූ නිලධාරියෙකු වශයෙන් මහජනයා තුළ ඇති කළ විශ්වාසනීයභාවයයි. සමහර පොලිස් නිලධාරීන්ට එල්ලවන ආකාරයේ දූෂණ චෝදනා කිසිවක් කිසිදු අයුරකින් ඔහු වෙත එල්ල නොවීය. කිසිදු විටක සිය නිල ඇඳුම ධනෝපායන මාර්ගයක් ලෙස භාවිතා නොකළ කොටකදෙනිය මහතාට එය හුදෙක්ම යුක්තිය හා සාධාරණත්වය ඉටුකිරීමේ මාධ්‍යයක් පමණක්ම විය.

ඔහුගේ මානව දයාව නිසාම විටෙක ඔහුට බොහෝ හිරිහැරයන්ට මුහුණ පෑමට සිදු විය. දකුණේ භීෂණ සමයේ දී ගම්පහ පොලිස් ස්ථානයට ක්ෂණික පරීක්ෂණයක් සඳහා පැමිණි ඒ මහතාට මාස එකහමාරක් වැනි දිගු කාලයක් සාධාරණ හේතුවක් නොමැතිව පොලිස් මේට්‍රන්වරියකගේ ආරක්ෂාව පවා නොමැතිව රඳවාගෙන සිටි තරුණියන් තිදෙනෙකු දක්නට ලැබිණ. ඔවුන්ව ඇප පිට නිදහස් කර ඔවුන්ගේ දෙමාපියන්ට බාර දීමට එතුමා කටයුතු කළේය. එහෙත් ඒ නිසා එතුමාව අනිවාර්‍ය නිවාඩු පිට සේවයෙන් ඉවත් කරන ලදි. නැවත සේවයෙහි පිහිටුවන ලද්දේ වසර එකහමාරකට පසුව වන අතර ඒ විනය පරීක්ෂණයේ දී තම නිර්දෝෂීභාවය ඔප්පු කිරීමෙන් පසුවය.

ඔහුගේ මානව දායවේ හස්තය දිගු වූයේ පොදු මහජනතාවට පමණක් නොවේ. පොලිස් නිලධාරීන්ගේ උන්නතිය සඳහාද විශාල වැඩ කොටසක් ඔහුගෙන් ඉටුවිය. එතුමා උප පොලිස් සේවය භාර නියෝජ්‍ය පොලිස්පති වශයෙන් වැඩ කරන අතර තුර 1996 වසරේදී උප පොලිස් සේවා පොලිස් නිලධාරීන්ට වැටුපක් දීමට හා ඔවුන්ව සේවයේ ස්ථිර කර විශ්‍රම වැටුපක් ලබා දීමට අවශ්‍ය අඩිතාලම සකස් කර 40,000 කට වැඩි නිලධාරීන්ට විශාල සහනයක් ලබා දීම ඒ අතරින් විශේෂිතය.

කොටකදෙනිය යන නාමය මේ රටේ ජන මනස තුළ වඩාත් තදින් හා ගෞරවාන්විත ලෙස ස්ථාපිතව ඇත්තේ කොටි ත්‍රස්තවාදයට එරෙහිව ඒ මහතා ක්‍රියාත්මක කළ දේශප්‍රේමී කාර්යක්ෂම හා දූරදර්ශී වැඩ පිළිවෙල හේතුවෙනි. 1984 දී යාපනයේ මෙහෙයුම් භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වශයෙන් ඒ මහතාව පත් කළත් නාග විහාරයට පහරදී විනාශ කළ කොටි ත්‍රස්තවාදීන්ට විරුද්ධව මෙහෙයුම් දියත් කළ නිසා කෙටි කලකින්ම ඔහුව එම පදවියෙන් ඉවත්කර කොළඹට මාරු කරන ලදී. ත්‍රස්තවාදයට එරෙහිව වර්තමානයේ ලැබෙන නිවැරදි දේශපාලන නායකත්වය එදා නොවූ බැවින් එසේ සිදු වූ බව පැහැදිලිය. කෙසේවෙතත් 1985 දී එවකට වව්නියාව කොට්ඨාශය භාර පොලිස් අධිකාරිවරයාව සිය කාර්යාලයේදීම ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කිරීමෙන් පසුව හිස් වූ එම තනතුර සඳහා කොටකදෙනිය මහතාව පත් කරන ලදී. එවකට එම කොට්ඨාශයට වව්නියාව, මන්නාරම,කිලිනොච්චිය හා මුලතිව් යන දිස්ත්‍රික්ක හතරම අයත් වූ අතර දෙමළ ජනතාගේ සිත් දිනා ගන්නා ගමන්ම කොටි ත්‍රස්තවාදී ක්‍රියාද පාලනය කිරීමට ඔහුට හැකි වූ අතර පොලිස්පති වරයා විසින් විශේෂ ප්‍රශංසාවක් ලිඛිතවම පිරිනමන ලදී

අනතුරුව 1986 වර්ෂයේදී නුවරඑළිය හා හැටන් ප්‍රදේශ වල සිංහල ජනතාව එම පළාතෙන් පලවා හැරී මේ අරමුණින් වතුකරයේ දියත් කළ ත්‍රස්තවාදි ක්‍රියා මෙල්ල කිරීමට එම ප්‍රදේශය භාර පොලිස් අධිකාරිවරයා අසමත් වූ අවස්ථාවේ කොටකදෙනිය මහතාව එම තනතුරට පත් කරන ලදී. ඉතා කෙටි කාලයක් තුළ ඔහුගේ නායකත්වය යටතේ තත්ත්වය සම්පූර්ණයෙන්ම පාලනය කරන ලද නමුත් විවිධ පුද්ගලයන්ගේ බලපෑම මත කොටකදෙනිය මහතා නැවත කොළඹට මාරු කරන ලදී.

විශේෂයෙන්ම සඳහන් කළ යුතු කාල පරිච්ඡේදයක් වන්නේ කොටකදෙනිය මහතා කොළඹ භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් සේවය කල කාලයයි. ඒ 1995 වර්ෂයයි. ඒ කොළඹ නගරයට ත්‍රස්තවාදී තර්ජන ඉතා බලවත්ව එල්ල වු කාලයකි. කොටකදෙනිය මහතා ඉතා විධිමත් සැලසුමක් කාර්යක්ෂමව ක්‍රියාත්මක කරමින් කොළඹට ඇතුලු වී සිටි කොටි ත්‍රස්තවාදීන් හඹායමින් ඔවුන්ව අත් අඩංගුවට ගැනීම ආරම්භ කොට ලැගුම් හල් ඇතුළු. සියලු සැක සහිත ස්ථාන නිරන්තර පරීක්ෂාවට ලක් කළේය. ඔහුගේ වැඩ පිළිවෙල සාර්ථක වූ අතර කොළඹ නගරයේ ත්‍රස්තවාදී ප්‍රහාර ඉතා අවම මට්ටමකට පැමිණියේය. එහෙත් සමහර දෙමළ දේශපාලනඥයින්ගේ බලපෑමට යටත් වූ හිටපු ජනාධිපතිනිය ඉක්මනින්ම ඔහුව එම තනතුරින් ඉවත් කළාය. අදූරදර්ශී තීරණයෙහි ප්‍රතිඵල වහාම ලැබුණි. ගලධාරි හෝටලයට හා ශ්‍රී ලංකා මහ බැංකුවට විශාල ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල විය.

ඔහු කළ විශිෂ්ඨ සේවය වෙනුවෙන් ඔහුට ලැබිය යුතුව තිබුණේ ගරු බුහුමන් වුවත් සිදුවූයේ එහි අනෙක් පැත්තයි. ත්‍රස්තවාදයට එරෙහිව ඍජු ප්‍රතිපත්තියක් නොතිබූ එවක පාලකයෝ සුදුසුකම් ලැබූ මොහොතේදී එතුමාට පොලිස්පති තනතුර ලබා දීම ප්‍රතික්ෂේප කළහ. 1998 වර්ෂයේ දී හිටපු පොලිස්පති විශ්‍රාම ගැනීමෙන් පසුව ඊ ළගට ජ්‍යෙෂ්ඨත්වයේ සිටි කොටකදෙනිය මහතා වෙනුවට ඔහුට වඩා ජ්‍යෙෂ්ඨත්වය අඩු එසේම වව්නියාව ක්‍රියාන්විත රාජකාරියේ යෙදීම ප්‍රතික්ෂේප කර අවුරුදු 10 කට පෙර පොලිස් සේවයෙන් ඉල්ලා අස්වූ තැනැත්තෙක් නැවත පොලිස් සේවයට බඳවාගෙන පොලිස්පති තනතුරට පත්කරන ලදී. ඉන්පසුව 2002 වර්ෂයේදී ඔහුගේ මරණයෙන් පසු හිස් වූ එම තනතුරට නැවත වරක් ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහලින් සිටි කොටකදෙනිය මහතා වෙනුවට ඔහුට වඩා අවුරුදු පහක් ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු නිලධාරියෙක් පොලිස්පති ලෙස පත්කරන ලදී. ඒ මේ විශිෂ්ඨ නිලධාරියාට සැලකූ ආකරයයි.

කොටකදෙනිය මහතා විවාහ වී සිටින්නේ පරිපාලන සේවයේ නියුක්තව දැනට විශ්‍රම ලබා සිටින සෝමා කොටකදෙනිය මහත්මිය සමගයි. ඇය මෝටර් රථ කොමසාරිස් පදවියට හා තැපැල්පති පදවියට පත් වූ මෙරට ප්‍රථම කාන්තාවයි. එම තනතුර දරමින් ඇය ද විශිෂ්ඨ සේවයක් කළ බව ප්‍රසිද්ධය. ඔවුනට දරු දෙදෙනෙකි. එසේම ඔවුන්ගේ පවුල්වල රණවිරුවන් බොහෝ දෙනෙක් සිටින අතර අනුරාධපුර ගුවන් හමුදා කඳවුර භාරව දැනට කටයුතු කරන ගෲප් කැප්ටන් සාගර කොටකදෙනිය මහතා ඔවුන්ගේ ඥාති සහෝදරයකු වන අතර කොටකදෙනිය මහත්මියගේ සහෝදරියගේ පුතා වන මේජර් එරංග රත්නායක මහතා යාපනයේ ත්‍රස්තවාදී වෙඩි ප්‍රහාරයකට ලක්ව දැනට ආබාධිත තත්ත්වයේ පසුවේ.

පිරිසුදු, අවංක, පරිණත, කාර්යක්‍ෂම, මානව දායවෙන් පිරි, දක්‍ෂ, රටට ආදරය කරන ආදී ඔහු වෙනුවෙන් යොදන හැම විශේෂණ පදයකටම උපරිම අරුතක් එක් කිරීමට ඔහු සමත්ය. කොටින්ම ඔහු ඡන්දයක් දීමට වටිනානම කෙනෙකි. රටට ජාතියට හා සමාජයට සිය යුතුකම නොපිරිහෙළා ඉටු කළ මේ විශිෂ්ඨ මිනිසා වෙනුවෙන් අපගේ කෘතවේදිත්වය පළ කළ යුතු මොහොත එළඹ තිබේ.

**එක්සත් ජනතා නිදහස් සංධානය ගම්පහ දිස්ත්‍රික්කය**

**24**